# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/34 - 2018 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක ................. දරන වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය පිළිබඳ ප්‍රඥප්තිය සංශෝධනය

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2018 අංක ........... දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය පිළිබඳ සංශෝධිත ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසු වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් එය එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ඩී. ජී. බී. එම්. ධර්මසිරි දසනායක,
ප්‍රධාන අමාත්‍ය,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන,
සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන,
සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
1 වෙන මහල,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.


1A - PG 4195 — 42 (2018/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## වයඹ පළාතේ පළාත් සභාව

2018 අංක ..... දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ (සංශෝධන) ප්‍රඥප්තිය

**2003 අංක 06 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 11 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වන ප්‍රඥප්තියකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උප ලේඛනයේ I වන (පළාත් සභා) ලැයිස්තුවේ 21 වන ව්‍යවස්ථාවට අනුකූලව ලැබී ඇති බලය අනුව වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා බලාත්මක වීම.

1. මෙම ප්‍රඥප්තිය 2018 අංක ....... දරන කර්මාන්ත සේවා කාර්යාංශ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඒ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු විට එය බලාත්මක වන්නේ ය.

1990 අංක 11 දරන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 2003 අංක 6 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 11 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කිරීමෙන් එය සංශෝධනය කරනු ලැබේ.

"වයඹ පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින්, ව්‍යවසාය සංවර්ධනය ඔස්සේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම පිණිස කර්මාන්ත සේවා කාර්යාංශය පිහිටුවීම සඳහාත්, එයට අදාළ වූ නැතහොත් ආනුෂංගික වූ කරුණු ගැන විධිවිධාන සැලැස්වීම සඳහාත් වූ ප්‍රඥප්තියකි. "

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වැනි වගන්තියේ යෙදී ඇති "වයඹ පළාතෙහි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන" යන වචන වෙනුවට ''ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන, 4 වන, 5 වන,6 වන සහ 7 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ඇති 2 වන, 3 වන, 4 වන, 5 වන,6 වනසහ7 වන වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"කර්මාන්ත සේවා කාර්යාංශය"

2. (1) මෙම ප්‍රඥප්තිය මගින් (මෙහි මින් මතු "කාර්යාංශය" වශයෙන් සඳහන් කරනු ලබන) වයඹ පළාතේ කර්මාන්ත සේවා කාර්යාංශය නමින් හැඳින්වෙන කාර්යාංශයක් පිහිටුවනු ලැබේ.

(2) කාර්යාංශය (1) වන උප වගන්තියේ ඊටදී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇත. තව ද, ඒ නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට හැකි වන්නේය.

කාර්යාංශයේ අරමුණු

3. කාර්යාංශයේ අරමුණු පහත සඳහන් පරිදි වන්නේ ය.

(අ) ව්‍යවසායයන් සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම;

(ආ) වැඩි ආර්ථික වර්ධනයක් උදෙසා පළාතට ව්‍යවසායකයන් ආකර්ෂණය කර ගැනීමට හිතකාමී පරිසරයක් ඇති කිරීම;

(ඇ) ව්‍යවසායකයන්ට හා ව්‍යවසායයන්ට අවශ්‍ය ව්‍යාපාර සංවර්ධන සේවා ලබා දීම;

(ඈ) ව්‍යවසායයන්හි පොදු, පෞද්ගලික හවුල් ප්‍රවර්ධනය කිරීම; සහ

(ඉ) දේශීය හෝ විදේශීය ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය හා ඇගයීම.

කාර්යාංශයේ කර්තව්‍යය

4. පහත දැක්වෙන කාර්ය ඇතුළුව කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය සියලු කාර්යයන් කාර්යාංශය විසින් සිදු කළ හැකි ය.

(අ) කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම; අවශ්‍ය විය හැකි කටයුතු සිදු කිරීම;

(ආ) පෙළඹවීම් ක්‍රම සහ මූලික පහසුකම් වලින් හෙබි සීඝ්‍ර ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ හිතකාමී ආයෝජන වාතාවරණයක් ඇති කිරීම;

(ඇ) ප්‍රරෝහණ ශක්තියෙන් යුත් ව්‍යවසායන් හඳුනා ගැනීමෙන් හා අවශ්‍ය ව්‍යාපාර සංවර්ධන සේවා ලබා දීමෙන් පළාතට ව්‍යවසායකයන් / ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම;

(ඈ) ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනික කටයුතු කරගෙන යාම, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන හා වැඩමුළු, අධ්‍යාපන චාරිකා සහ දැනුම හා තොරතුරු පතුරුවාලීම සඳහා අදාළ වැඩසටහන් පැවැත්වීම;

(ඉ) ව්‍යාපාර හා වෙළඳපොළ ප්‍රවර්ධනය උදෙසා වෙළඳ සල්පිල් හා වෙළඳ දූත පිරිස් සංවිධානය, සම්බන්ධීකරණය හා ඒවා සහභාගී වීම;

(ඊ) අලෙවිකරණය සම්බන්ධයෙන් ආධාර අපේක්ෂා කරන ව්‍යවසායකයන්ගෙන් ලැබෙන ඉල්ලීම් සඳහා ක්‍රියා කිරීම, අලෙවිකරණ පහසුකම් ඇති අංශවලට අයත් නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අනුබල දීම;

(උ) කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේදී හා තිරසරභාවය තහවුරු කරගැනීමේදී දේශීය හා විදේශීය ආධාර දෙන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධ වීම හා එමගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා කළමනාකරණ හා උපදේශන සේවා ලබා දීම;

(ඌ) ගුණාත්මක සංවර්ධනය හා කාර්ය සාධකතාව වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ නව ක්‍රම උපයෝගී කර ගැනීම සඳහා අනුබල දීම;

(එ) සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායකයන්ගේ කාර්මික හා පාරිසරික ගැටලු සඳහා අවශ්‍ය තාක්ෂණික විසඳුම් ලබා දීම;

(ඒ) රාජ්‍ය හා පෞද්ගලික අංශය සඳහා තාක්ෂණික වාර්තා, ඇගයීම් වාර්තා, තක්සේරු වාර්තා සහ ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම;

(ඔ) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව කාර්යාංශයේ තිරසාර භාවය සහ ඉදිරි පැවැත්ම තහවුරු කර ගැනීම සඳහාත් ඒ තුළින් ඉහතින් සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහාත් පළාත තුළ ද, පළාතෙන් පිටත ද, කර්තව්‍යන්හි නියැලීම.

කාර්යාංශයේ වගකීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කාර්යාංශය වෙත යොමු කරනු ලබන කරුණු පිළිබඳ උපදෙස් දීම කාර්යාංශයේ වගකීම විය යුතු ය.

කාර්යාංශයේ බලතල

6. ස්වකීය කාර්යයන් ඉටුකර ගැනීම හා වගකීම් ඉටුකිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බලතල කාර්යාංශයට තිබෙන අතර, විශේෂයෙන්ම පහත දැක්වෙන බලතල කාර්යාංශයට තිබිය යුතු ය.

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් සන්තකයට ගැනීම නැතහොත් දැරීම, බදු ගැනීම හෝ දීම, කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපන (උකස්) කිරීම;

(ආ) කාර්යාංශයේ කාර්ය සඳහා, පාලක මණ්ඩලයකින් අනුමත කරනු ලබන කවර හෝ බැංකුවක ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම;

(ඇ) පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන කවර හෝ බැංකුවකින් ස්වකීය කර්තව්‍යය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණ ණයට ගැනීම;

(ඈ) කර්මාන්ත /ව්‍යවසායන් දිරිගැන්වීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම;

(ඉ) කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම සඳහා හවුල් ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තු ගිවිසුම්වලට හෝ සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඊ) ව්‍යවසාය සංවර්ධනයේ සියලු අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහාය වීම, සම්බන්ධීකරණය හා අනුබල දීම;

(උ) කාර්යාංශය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම;

(ඍ) කාර්යාංශයට කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම;

(එ) සිය සේවකයන් පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික, අභිප්‍රේරණ සහ දිරි දීමනා ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, හැසිරීම සහ ඔවුන්ට නිවාඩු ලබා දීම පිළිබඳ රීති සම්පාදනය කිරීම;

(ඒ) සිය සේවකයන් සඳහා කාර්ය නියමයන් ඇති කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයුම සහ අවශ්‍ය පිළියම් යෙදීම;

(ඔ) කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම හා කාර්යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි උපකරණ, අරමුදල් සහ වෙනත් ආධාර පිළිගැනීම;

(ඕ) කාර්යාංශයේ අරමුණු ඉටු කරගැනීමේ දී යම් නිශ්චල දේපළක් හෝ ඉඩම් පවරා ගැනීමක් හෝ සිදු කරනු පිණිස අවශ්‍ය වන මුදල් කාර්යාංශය මගින් දැරීම;

(ක) අවශ්‍ය වන අවස්ථාවල දී බාහිර උපදේශකවරයන්ගේ සේවය ලබාගැනීම හා ඒ වෙනුවෙන් ගෙවීම් කිරීම;

කාර්යාංශයේ දෙපාර්තමේන්තු, අංශ හා නියෝජිතායතන

7. සිය කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තු, අංශ හා නියෝජිතායතන කාර්යාංශය විසින් පිහිටුවා, පවත්වා ගෙන යා හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ II කොටසේ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ ශීර්ෂ පාඨය වන "කාර්යාංශයේ මණ්ඩලය" යන්න වෙනුවට "කාර්යාංශයේ පාලක මණ්ඩලය" යන නව ශීර්ෂ පාඨය මෙයින් ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"කාර්යාංශයේ පාලක මණ්ඩලය"

8. (1) කාර්යාංශයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "පාලක මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්යාංශයේ පාලක මණ්ඩලය" වෙත පැවරෙන්නේ ය.

(2) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, පාලක මණ්ඩලය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය වෙත පැවරී ඇති, නියම වී ඇති හෝ භාර වී ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාවේ යෙදිය හැකි ය, ඉටු කළ හැකි ය, කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියට 8 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

"පාලක මණ්ඩලයේ සංයුතිය" 8 අ

8 (අ)(1) පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් සිව් දෙනෙකුගෙන්, එනම්;

(i) වයඹ පළාතේ ප්‍රධාන ලේකම්;

(ii) වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්;

(iii) වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්;

සහ

(iv) වයඹ පළාත් පේෂකර්ම, කුඩා කර්මාන්ත සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්

(ආ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් ප්‍රධාන විධායක නිලධරයාගේ නිර්දේශ සැලකීමට ගනිමින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් පස් දෙනෙකුගෙන්;

(i) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වාණිජ හෝ සංවර්ධන බැංකුවක සහකාර මහා කළමනාකරුවකුට නොඅඩු මට්ටමේ තනතුරක සේවය කරන විධායක නිලධරයකු, බැංකු ක්ෂේත්‍රය නියෝජනය කිරීම පිණිස;

(ii) වයඹ පළාතේ පිහිටි ප්‍රමුඛ පෙළේ මහා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත ආයතනයක හිමිකරුවකු, ප්‍රධාන විධායක නිලධරයකු, කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කිරීම පිණිස;

(iii) පෞද්ගලික අංශයේ මහා පරිමාණ ව්‍යවසායක හිමිකරුවකු හෝ සේවා අංශයේ ප්‍රධාන විධායක නිලධරයකු, ව්‍යාපාරික හෝ සේවා ක්ෂේත්‍රය නියෝජනය කිරීම පිණිස;

(iv) විශ්වවිද්‍යාලයක සේවය කරන කළමනාකරණ හෝ ආර්ථික විද්‍යාව හෝ කෘෂිකර්ම හෝ ඉංජිනේරු ශිල්පය හෝ පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හෝ අංශ ප්‍රධානියෙක් හෝ පීඨාධිපතිවරයෙක් හෝ ජාතික මට්ටමේ කර්මාන්ත, වෙළඳ හා වාණිජ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සැලසුම් පිළිබඳ ප්‍රවීණයෙක්;

(v) පළාත් හෝ ජාතික මට්ටමේ ප්‍රමුඛ පෙළේ පෞද්ගලික ආයතනයක සේවය කරන වරලත් ගණකාධිකාරීවරයෙක්;.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

පළාත් සභා මන්ත්‍රීවරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, පළාත් පාලන සභිකයෙක්, සිහි විකල් තැනැත්තෙක්, වස්තු භංගත්වයට පත් තැනැත්තෙක් හෝ සාපරාධී වරදකට වරදකරුවකු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබූ තැනැත්තෙක් කාර්යාංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට සුදුසුකම් නොලබයි.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි ඇති "නම් කරනු ලබන සෑම සාමාජිකයෙක් ම" යන වචන වෙනුවට"පත් කරනු ලබන සෑම සාමාජිකයකු ම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්;

"පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය"

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියෙහි ඇති "යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේ නම්, 9 වන වගන්තියට යටත්ව ප්‍රධාන අමාත්‍යවරයා විසින්, අමාත්‍යවරයා විමසා සාමාජිකයකු වශයෙන්" යන වචන වෙනුවට "පත් කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේ නම්, 8 අ සහ 9 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව ප්‍රධාන අමාත්‍යවරයා විසින් සාමාජිකයකු වශයෙන්" යනුවෙන් සංශෝධනය කෙරේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"පත් කළ සාමාජිකයන් ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම.

12 (1) ප්‍රධාන අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් පත් කළ සාමාජිකයකුට තම ධුරයෙන් ඉවත් විය හැකිය. ප්‍රතියෝජනය කිරීම.

(2) උචිත යැයි ප්‍රධාන අමාත්‍යවරයාට හැඟේ නම් ඒ සඳහා හේතු දක්වා පත් කළ සාමාජිකයකු ඉවත් කිරීමට ප්‍රධාන අමාත්‍යවරයාට හැකි වන්නේ ය.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ ඇති "අදාළ අමාත්‍යවරයා විමසා"යන වචන ඉවත් කිරීමෙන් එය සංශෝධනය කෙරේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට පහත සඳහන් නව උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එය සංශෝධනය කෙරේ.

"(4) පාලක මණ්ඩලයේ සභාපතිවරයාට නොදන්වා, පාලක මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට සහභාගී වීමට අපොහොසත් වන නම් කළ සාමාජිකයකුගේ සාමාජිකත්වය එසේ නොපැමිණෙන තුන් වන රැස්වීම් දින සිට අහෝසි වේ. එවැන්නෙකු නැවත පාලක මණ්ඩලයේ සාමාජිකත්වයට පත් කිරීමට සුදුස්සකු නොවන්නේ ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ ඇති (1) සහ (2) උප වගන්තිවල "අමාත්‍යවරයා විසින්" යන වචන වෙනුවට "ප්‍රධාන අමාත්‍යවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන සහ 24 වන වගන්ති සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ ඇති 23 වන සහ 24 වන වගන්තිවල හා එහි පැති සටහන්වල කවර හෝ තැනක යෙදී ඇති "අධ්‍යක්ෂවරයා" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "විධායක අධ්‍යක්ෂවරයා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එය සංශෝධනය කරනු ලැබේ.

"කාර්යාංශයේ ගිණුම් විගණනය.

30. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ''කාර්යාංශයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එය සංශෝධනය කරනු ලැබේ.

"කළමනාකරණ විගණනය

31. කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීමේදී කොතෙක් දුරට එය සාර්ථකව ඉටුකර තිබේදැයි තහවුරු කර ගැනීම පිණිස මණ්ඩලය විසින් නිසි සුදුසුකම් ලත් කළමනාකරණ විගණකවරයන්ගේ සේවය ලබාගත හැක. කළමනාකරණ විගණකවරයන්ගේ නිර්දේශ පදනම් කරගනිමින් මණ්ඩලය විසින් කාර්යාංශයේ කළමනාකාරීත්වයට දෙනු ලබන උපදෙස් කළමනාකාරීත්වය විසින් ක්‍රියාත්මක කළ යුතු වන්නේය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එය සංශෝධනය කෙරේ.

"වාර්ෂික වාර්තාව

32. සෑම මුදල් වර්ෂයක්ම අවසන් වූ විට ඒ වර්ෂය තුළදී කාර්යාංශය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කර ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අදාල මුදල් වර්ෂය ඉකුත් වී මාස දොළහක කාලයක් ඉකුත් වීමට මත්තෙන් එම වාර්තාව පළාත් සභාව ඉදිරියේ තැබීමට ඔහු විසින් ක්‍රියා කළ යුතු ය."

19 ප්‍රධාන ප්‍රඥප්තියේ කවර හෝ විධිවිධානයක "මණ්ඩල" යන වචනය යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "පාලක මණ්ඩලය" යන වචනය ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබයි.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටසේ 34 වන වගන්තියේ ආරම්භයේදීම"මූල්‍ය රීති හා ආයතන රීති ඇතුළුව" යන පද එකතු කිරීමෙන් එය සංශෝධනය කෙරේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එය සංශෝධනය කෙරේ.

"අර්ථ නිරූපණය 42. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම ප්‍රඥප්තියෙහි -

"ආණ්ඩුකාරවරයා"යන්නෙන් වයඹ පළාත් ආණ්ඩුකාරවරයා අදහස් කෙරේ.

"කර්මාන්ත සේවා"යන්නට ව්‍යාපාර සංවර්ධන සේවා ද ඇතුළත් වේ.

"පළාත් සභාව"යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව අදහස් කෙරේ.

"ප්‍රධාන අමාත්‍යවරයා"යන්නෙන් වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් කෙරේ.

"පළාත"යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාත අදහස් කෙරේ.

"සුදුසුකම් ලත් විගණකවරයා"යන්නෙන් ,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ;හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්;

අදහස් වේ.

"පෙළඹවීම් ක්‍රම"යන්නෙන්, දිරි ගැන්වීම් ක්‍රම අදහස් වේ.

"ව්‍යවසායන්"යන්නෙන්, කෘෂිකර්මාන්ත, ධීවර, පශු සම්පත්, වෙළඳ, වාණිජ ව්‍යාපාර හා සේවා, කර්මාන්ත හා ව්‍යවසායන් අදහස් වේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියට ඉක්බිතිවම 43 වන වගන්තිය වශයෙන් පහත දැක්වෙන වගන්තිය අලුතින් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කෙරේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය අලුතින් එකතු කිරීම.

43. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුව හොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය." "අනනුකූලත්වයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

09 - 365

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.